# ජපානයේ රැකියා සිහිනය සැබෑ කර ගැනීමට ඔබට අනගි අවස්ථාවක්

### ඉදිකිරීම් ක්ෂේත්‍රය (Construction) (පිරිමි)
### සාත්තුසේවා ක්ෂේත්‍රය (Caregiving) (කාන්තා)

කුසලතා සංවර්ධන රැකියා වැඩසටහන (ESD) යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ - පිරිමි (Construction-Male) සහ සාත්තු සේවා ක්ෂේත්‍රයේ - කාන්තා (Caregiving-Female) රැකියා සඳහා අයදුම්කරුවන් දැනුවත් කිරීමේ හා බඳවාගැනීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දී පැවැත්වේ.

ඒ සඳහා පහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අදාල සහතිකපත් හා ලිපිලේඛන ද සහිතව 2026.11.03 දින පෙ.ව.8.30 ට අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරය වෙත පැමිණෙන්න.

**(සැ.යු.මින් පෙර ජපානය සඳහා වීසා අයදුම්කර ප්‍රතික්ෂේප වී ඇති අයදුම්කරුවන් මෙ සඳහා අයදුම් කිරීමෙන් වලකින්න)**

**ඉදිකිරීම් අංශය සඳහා අවශ්‍ය මූලික සුදුසුකම්:**

- වයස අවු.18-30 අතර විය යුතුය.
- ජපන් භාෂා ප්‍රවීනතා විභාග JLPT, NAT විභාග වලින් **N5** මට්ටම හෝ JFT A1 හෝ ඊට ඉහළ සුදුසුකම් තිබිය යුතුය.
- වසර 13 ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කර තිබිය යුතුය. ( අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිටීම හෝ NVQ 3 මට්ටම හෝ ඊට ඉහළ වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.)
- ශරීරයේ Tattoos නොතිබිය යුතුය.
- උස 160 cm හෝ ඊට වැඩිවිය යුතුය.
- බර 50 Kg හෝ ඊට වැඩිවිය යුතුය.
- වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය.

**සාත්තුසේවා අංශය සඳහා අවශ්‍ය මූලික සුදුසුකම්:**

- වයස අවු.18-30 අතර විය යුතුය.
- ජපන් භාෂා ප්‍රවීණතා විභාග JLPT , NAT විභාග වලින් **N4** මට්ටම හෝ JFT විභාගය සමත් වීම (A2.2) හෝ ඊට ඉහළ සුදුසුකම් තිබිය යුතුය.
- වසර 13 ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කර තිබිය යුතුය. ( අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිටීම හෝ NVQ 3 මට්ටම හෝ ඊට ඉහළ වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.)
- ශරීරයේ Tattoos නොතිබිය යුතුය.
- උස 150 cm හෝ ඊට වැඩිවිය යුතුය.
- බර 40 Kg හෝ ඊට වැඩිවිය යුතුය.
- වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය.

**අවශ්‍ය ලිපිලේඛන.**

- සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (අයදුම්පත්‍රය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ www.slbfe.lk වෙබ් අඩවියේ පලකර ඇත.)
- පාසැල් අස්වීම් සහතිකය
- අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල සහතිකය / NVQ සහතික
- ජාතික හැඳුනුම්පත
- JLPT, NAT හෝ JFT සහතිකය සහ ප්‍රතිඵල ලේඛනය

**වැඩි විස්තර සඳහා 1989 ක්ෂණික ඇමතුම් අංකය අමතන්න**

**(බඳවාගැනීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් පමණි.)**

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය